**2025-11-12 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 නොවැම්බර් මස 12 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ -**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා

**<u>01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම</u>**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ මන්ත්‍රීතුමියක් ඉදිරිපත් වෙලා ඒක සභා සම්මත කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා</u>**
පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය මස මහාසභා වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන</u>**
ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීතුමියනි, මාධ්‍යවේදී සහෝදරයිනි, ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි. අපිට විශේෂයෙන්ම මතක් කර ගන්න ඕන හැමෝම දන්නවා අපට මේ ගරු සභාව තියන්න තිබුණේ 13 වෙනිදා ඒ කියන්නේ හෙට. නමුත් අපි ඒකාබද්ද කාරක සභාව රැස් කරපු අවස්ථාවේ කට්ටිය එක්ක කතා කරලා තීරණයකට ආවා අත්‍යාවශ්‍ය වැඩක් යෙදිලා තියෙන නිසා 12 වෙනිදාට ගමු කියලා. ඒ අනුව අපි පසුගිය සතියේ 04 වෙනිදා විශේෂ මහා සභාව තිබ්බා. ඒකෙදි 13 තියන්න තිබුණු සභාව 12 වෙනිදට තියන්න ඕනි නිසා අපි කාරක සභා තීරණය අනුව දිනය සංශෝධනය කරන්න අදහස් කරන බව පැවසුවා. මොකද විශේෂ රැස්වීමකදී අපි මේක දැනුම් දෙන්න ඕනි නිසා. ඔබතුමන්ලාගෙන් ඒ පිළිබඳව ගැටලුවක් පැන නැගුණෙ නැති නිසා තමයි අපිට අද මහා සභාව යොදා ගන්න පුළුවන් වුණේ. ඒ වගේම විශේෂයෙන් මතක් කරන්න ඕනි අපිට 13 කියන්නේ ඉතාමත් කළු දිනයක්. අපේ රටේ හිටපු ඒ මහා මානවවාදියා ඇතුළු ඒ සත්‍ය වෙනුවෙන් පෙනී හිටපු අති බහුතරයක් ඝාතනය කරපු දවස සමරන දවස තමයි 13 තියලා කියන්නේ .ඉතින් අපිට ඒ දිනය මග හරින්න බැහැ. ඉතින් මම මේ සභාවේ සභාපතිවරයා විදියට ඒ අය වෙනුවෙන් අපේ උපහාරය පිරිනමනවා. ඒ අයගේ බලාපොරොත්තුව තමයි යුක්තිගරුක දේශයක් , නීතිය සැමට ක්‍රියාත්මක වන යුක්තිගරුක සමාජයක්, ඒ කියන්නේ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් හැමෝටම උදාකරලා දීම. ඒ නිසා අපි දන්නවා මේ වර්තමාන ආණ්ඩුව මැතිවරණ 03න් ජයග්‍රහණය කරලා කිසිඳු කෙනෙකුට හිරිහැරයක් නැතුව හැමෝටම මේ ජයග්‍රහණය බෙදාහදා ගන්න පුළුවන් තරමට ඉස්සරහට ගෙනාවා. ඒක නිසා ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, තවමත් මේ රජයෙන් අපට උපදෙස් දෙන්නේ විශේෂයෙන්ම මේ පළාත් පාලන ආයතන වල පක්ෂ විපක්ෂ බෙදන්නේ නැතිව එකම සභාවක සභිකයන් විදියට සළකන්න කියලා. මං හිතනවා අපි බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ඒක ක්‍රියාත්මක කරනවා කියලා. යම් යම් අඩුපාඩුකම් සිද්ධ වෙන්න ඇති, අපි ඒවා වෙනම සාකච්ඡා කරමු. අපි එක රැනක අය විදියට එක මිටට එකතු වෙලා අපි ඒ තේමා පාඨය වෙනුවෙන් වැඩ කරමු. ඒ නිසා අපි සංවර්ධන වැඩ කරනකොට පක්ෂ විපක්ෂ නැතුව හැම මන්ත්‍රීතුමෙක්ම, තුමියක්ම කියන දේවල් අපි කරනවා. විශේෂයෙන්ම අපිට ගිය සභාවේ විදී ලාම්පු පිළිබඳ කතාවක් ආවා. මං හිතන්නේ ඒක මේ වෙනකොට නිරාකරණය වෙලා තියෙන්නේ. ඉතින් අන්න ඒ යථාර්තය ඉෂ්ඨ කර ගන්න තමයි අපි මහන්සි වෙන්න ඕනි. මට මතකයි මැක්සිම් ගෝර්කිගේ අම්මා නව කතාව කියන කොට ඒ පාවෙල්ගේ ගෙදර තියෙනවා අධ්‍යාපන සාකච්ඡාවක්. පාවෙල් අම්මාට කියනවා අම්මේ නීති විරෝධි සාකච්ඡාවක් කරන්නේ කියලා. ඒ නිසා අම්මා තමයි ඔත්තු බැලුවේ. අම්මා ඒ සාකච්ඡාව හොරෙන් අහගෙන ඉඳලා පුතාට කියනවා, පුතේ ඔයා මට බොරු කීවා නේද. ඔගොල්ලෝ කතා කළේ නීති විරෝධි දේවල් නෙවෙයි සත්‍යගරුක දේවල්නේ කියලා.පුතා කියනවා අම්මේ අසත්‍ය , අයුක්තිය රජ කරන මොහොතක යුක්තිය සහ සාධාරණත්වය තමයි නීති විරෝධි කියලා. අන්න ඒ වගේ තත්ත්වයකට තමයි අපි එදා මුහුණ දුන්නේ. ඒ වගේම අපි බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විදියට ඉතාමත් දුෂ්කර තත්ත්වයක් යටතේ , ඉතාමත් අඩු පහසුකම් යටතේ තමයි ඉන්නේ. අද අපේ ටෙන්ඩර් කමිටුව තිබුණා. ඒ කමිටුව පවත්වන කොටත් අපේ මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට ඉඳ ගන්නවත් තැනක් තිබුණේ නැහැ. ඒ නිසා ඉතා සතුටුයි කියන්න අපි කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ පටන්

ගන්නවා. ඒ වගේම අපිට තාම කසළ බැහැර කරන්න ස්ථානයක් නිරවුල් වුණේ නැහැ. අපි අමාත්‍යාංශයටත් ලියුම් යොමු කරලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඒකත් ඉක්මනින් නිරවුල් කර ගන්න. ඒ වගේ දුෂ්කර තත්ත්වයන් තියෙනවා. ඒ වගේම අපේ පොළවල් ගත්තොත් විශේෂයෙන්ම වෙළිඔය පොළේ විවිධ දුෂ්කරතාවන් සහ ගැටලු තියෙනවා. අපේ ජගත් මන්ත්‍රීතුමා මේකට මැදිහත් වුණා උපරිමෙන්ම. අපි බලාපොරොත්තු වෙනවා ශ්‍රම දානයක් දාලා පොළක් විදියට මේක සකස් කරන්න. අපි ඔබතුමන්ලාගේ සහයෝගය මේකට අපේක්ෂා කරනවා.

**<u>03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා</u>**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා අසනීප තත්ත්වයේ පසුවන බැවින් අද දින සභාවට සම්බන්ධ වෙන්න හැකියාවක් නැහැ කියලා, නිවාඩු ඉල්ලීම් කරපු ලිපියක් සභාගත කරලා තියෙනවා. ඒ අනුව ඔහුගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමාගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම</u>**

ඉදිරිපත් වී නැත

**<u>05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>** - ඉදිරිපත් වී නැත.

**<u>06. යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව.(කේ.පී.රූපිකා ප්‍රියදර්ශනී ගුණපාල මිය)**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රෝහණ ජගත් වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

බළන්ගොඩ කල්තොට පාරේ පිහිටලා තියෙන වරිපනම් අංක 1092 කියන දේපල, මීට පෙර අයිතිකරු වන කේ.පී.ගුණපාල කියන නමට තමයි වරිපනම් ලේඛනයේ සඳහන් වෙලා තියෙන්නේ. දැන් ඔහුගේ දියණිය විසින් ඉල්ලුම් කරලා තියෙනවා එම දේපලවලට අදාළව කේ.පී.රූපිකා ප්‍රියදර්ශනී ගුණපාල කියන නමින් වරිපනම් ලේඛනය සංශෝධනය කරලා දෙන්න කියලා.අවශ්‍ය ලිපි ලේඛන ඔක්කොම මේකට අමුණලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ කල්තොට පාරේ වරිපනම් අංක 1092 දරන දේපලවලට අදාළව, වරිපනම් ලේඛනය කේ.පී.රූපිකා ප්‍රියදර්ශනී ගුණපාල කියන නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව.(හේරත් මුදියන්සේලාගේ කුසුම් හේරත් දිසානායක මිය)**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේකත් අර කලින් යෝජනාව වගේම එකක්. බළන්ගොඩ කල්තොට පාරේ පිහිටලා තියෙන වරිපනම් අංක 1078 කියන දේපල, මීට පෙර අයිතිකරු වන කිතුලමුල්ල ගමගේ අනුෂ්ක නුවන්ප්‍රිය කියන නමට තමයි වරිපනම් ලේඛනයේ සඳහන් වෙලා තියෙන්නේ. දැන් මිලදී අරන් තියෙන පාර්ශවය විසින් ඉල්ලුම් කරලා තියෙනවා එම දේපලවලට අදාළව හේරත් මුදියන්සේලාගේ කුසුම් හේරත් දිසානායක කියන නමින් වරිපනම් ලේඛනය සංශෝධනය කරලා දෙන්න කියලා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ කල්තොට පාරේ වරිපනම් අංක 1078 දරන දේපලවලට අදාළව, වරිපනම් හේරත් මුදියන්සේලාගේ කුසුම් හේරත් දිසානායක කියන නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දීර්ඝකාලීන බදු පදනම මත වාණිජ කටයුතු සඳහා ක.සි.අංක 620060 රජයේ ඉඩම් කොටස ලබා දීම සම්බන්ධ යෝජනාව- බටුගම්මන ග්‍රාම නිළධාරි වසම**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ ඉඩම් අයිති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. බටුගම්මන ග්‍රාම නිළධාරි වසමේ එච්.ඒ.අජිත් කුමාර කියන කෙනාට වාණිජ කටයුත්තක් සඳහා ඒ කියන්නේ ගරාජයක් පවත්වා ගෙන යන්න දිර්ඝ කාලීන බදු පදනම යටතේ තමයි බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් , ක.සි.අංක 620060 හි කලාප අංක 01හි කැබලි අංක 54 හි මුවාකැපුතැන්න කියන ඉඩමෙන් පර්චස් 10ක් ලබා දෙන්නේ. එතකොට මේක අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටලා තියෙන නිසා තමයි අපේ එකඟතාවය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉල්ලන්නේ. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව ක.සි.අංක 620060 හි කලාප අංක 01හි කැබලි අංක 54 හි මුවාකැපුතැන්න කියන ඉඩමෙන් පර්චස් 10ක් ලබා දීමට එකඟ බව, බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දීර්ඝකාලීන බදු පදනම මත කෘෂිකාර්මික කටයුතු සඳහා ක.සි.අංක 620017 රජයේ ඉඩම් කොටස ලබා දීම සම්බන්ධ යෝජනාව- තන්ජන්තැන්න ග්‍රාම නිළධාරි වසම**

මෙම යෝජනාව ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ යෝජනාවත් අර කලින් එක වගේමයි. තන්ජන්තැන්න ග්‍රාම නිළදාරි වසමේ ජී.ජේ.එස්.ඉකෝ ෆුඩ්ස් කියන ආයතනයට අඹ හා කුරුඳු ව්‍යාපෘතියක් පවත්වා ගෙන යන්න දිර්ඝ කාලීන බදු පදනම යටතේ කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් , ක.සි.අංක 620017 හි කලාප අංක 02හි

කැබලි අංක 01 න් කොටසක් වෙන විදියට අක්කර 02 ක් ලබා දෙන්නේ. එතකොට මේකත් අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටලා තියෙන නිසා තමයි අපේ එකඟතාවය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉල්ලන්නේ. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව ක.සි.අංක 620017 හි කලාප අංක 02හි කැබලි අංක 01 න් කොටසක් වන ලෙස අක්කර 02 ක් ලබා දීමට එකඟ බව, කල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ඉඹුලමුර මහරත්ගොඩ වෙල්යායට හියුම් පයිප්ප ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
මේ යෝජනාව ගැන කතා කරන කොට, ගොවිජන සේවා එකෙන් සභාව දැනුවත් කරලා තියෙනවා ඉඹුලමුර මහරත්ගොඩ වෙල්යායේ තියෙන පාර නිසා කෘෂිකාර්මික කටයුතු කරන්න අමාරුයි කියලා. ඒ අනුව අපේ කාර්මික නිළධාරින් ගිහිල්ලා ඉවර වෙලා නිර්දේශයක් දීලා තියෙනවා අඩි 1.5 ක විශ්කම්භය සහිත දිග අඩි 08න් යුක්ත හියුම් පයිප්ප 02ක් ප්‍රජා පාදක සමිතියකට නිකුත් කරලා අදාළ කාර්යය ඉටු කර ගන්න එක සුදුසුයි කියලා. ඒ අනුව මේ හියුම් බට 02ක ලබා දෙන්න අපිට සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව ඉඹුලමුර මහරත්ගොඩ වෙල්යායේ මාර්ගයට අවශ්‍ය අඩි 1.5 ක විශ්කම්භය සහිත දිග අඩි 08න් යුක්ත හියුම් පයිප්ප 02 ක ප්‍රජා පාදක සමිතියකට නිකුත් කොට, අදාළ කාර්යය ඉටු කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන අල්දොර සුසාන භූමිය අසළින් ගොඩවෙල මාර්ගයට හියුම් පයිප්ප ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>
මේකත් අපේ කාර්මික නිළධාරිතුමා පරීක්ෂා කරලා නිර්දේශයක් දීලා තියෙනවා අඩි 02ක් විශ්කම්භය සහිත දිග අඩි 08න් යුක්ත හියුම් පයිප්ප 01කුත්, දිග අඩි 04න් යුක්ත හියුම් පයිප්ප 01කුත් වන පරිදි හියුම් පයිප්ප 02ක් ප්‍රජා පාදක සමිතියකට නිකුත් කරලා අදාළ කාර්යය ඉටු කර ගන්න එක සුදුසුයි කියලා. ඒ අනුව මේ හියුම් බට 02ක ලබා දෙන්න අපිට සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව අල්දොර සුසාන භූමිය අසළින් ගොඩවෙල මාර්ගයට අඩි 02ක් විශ්කම්භය සහිත දිග අඩි 08න් යුක්ත හියුම් පයිප්ප 01කුත්, දිග අඩි 04න් යුක්ත හියුම් පයිප්ප 01කුත් වන පරිදි හියුම් පයිප්ප 02ක් ප්‍රජා පාදක සමිතියකට නිකුත් කොට, අදාළ කාර්යය ඉටු කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් අංක 173 / 173A දේපලවල වාර්ෂික වටිනාකමින් 95%ක් අඩු කර 2026 වර්ෂයේ බිල් කිරීම් සිදු කිරීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේක වැලිගෙපොල පාරේ දාමහනේ තියෙනේ. අපේ ආදායම් පරීක්ෂක තුමන් විසින් වාර්තාවක් දීලා තියෙනවා මේ වරිපනම් අංක 173 සහ 173A වලට අදාළ වයිනා කේබල් ආයතනය 2025 වර්ෂයේ මැද සිට තමන්ගේ සියලු ව්‍යාපාර කටයුතු නවත්තලා තියෙනවා කියලා. ඒ නිසා අපේ ප්‍රාදේශීය සභා පනතේ 145 වගන්තිය අනුව 2026 වර්ෂයේ ඉඳන් මේකේ තක්සේරු වටිනාකමින් 95%ක් අඩු කරලා ඉතුරු 5%ක ප්‍රමාණය වරිපනම් විදියට අය කර ගැනීම සුදුසු බවත් නැවත එම ව්‍යාපාරය ආරම්භ කළොත් ඒ ආරම්භ කරන පළමු දිනයේ ඉඳන්ම නැවත නිවැරදි තක්සේරුවටම වරිපනම් අය කර ගැනීම සුදුසුයි කියලත් කියනවා. එතකොට අර 2026 වර්ෂයේ 5% අය කර ගැනීම කියන එකේදී, වරිපනම් අංක 173 න් රු.198.04කුත්, වරිපනම් අංක 173A කියන එකෙන් රු.2333.70කුත් තමයි වාර්ෂික තක්සේරු මුදල විදියට අය කරන්න වෙන්නේ. අපිට මේකේ 95%ක ප්‍රමාණය අඩු කරන්න සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව 2026 වර්ෂයේ බිල් කිරීම් වලින් වරිපනම් අංක 173 සහ 173A වලට අදාළව තක්සේරු වටිනාකමින් 95%ක ප්‍රමාණය අඩු කර අය කිරීමටත්, නැවත එම ව්‍යාපාරය ආරම්භ කළහොත් ඒ ආරම්භ කරන පළමු දිනයේ සිටම නැවත නිවැරදි තක්සේරුවටම වරිපනම් අය කර ගැනීමටත් අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දාමහන ආදාහනාගාරය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය හා ගිවිසුම් ගත වීමේ ඉදිරි කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට මතක ඇති. මොකද 2025-09-11 තිබුණු මහ සභාවේ තීරණ අංක 12 යටතේ අපි අනුමැතිය දුන්නා සීමිත මිල ගණන් කැඳවලා දාමහන ආදාහනාගාරයේ අලුත්වැඩියා කටයුතු කරන්න කියලා. ඊට පස්සේ අපි පළාත් සභාවේ තිබුණු සාකච්ඡාවකට සම්බන්ධ වුණු වෙලාවේ අපට උපදෙස් දුන්නා මේක ලක්ෂ 20ට වඩා වැඩි කර්මාන්තයක් හින්දා පත්තරේ දැන්වීමක් දාලා විවෘත ටෙන්ඩර් ක්‍රමයට ප්‍රසම්පාදනය කරන එක තමයි සුදුසු කියලා. මේක අත්‍යාවශ්‍ය කටයුත්තක් නිසා ඉක්මනින් කරන්නත් ඕනි. ඒ එක්කම අපේ තව ව්‍යාපෘති 03ක් ඇවිල්ලා තිබුණේ පත්තරේ පළ කරලා ටෙන්ඩර් කැඳවන්න. ඊට පස්සේ අපි අර ව්‍යාපෘති ටිකත් එක්කම ආදාහනාගාරේ ටෙන්ඩර් දැන්වීමත් දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල පළ කළා. අපේ හාමුදුරුවනේ මේ පත්තර දෙකේ දැන්වීම දාන්න අපිට එක් ලක්ෂ හයසිය ගාණක් ගියා. මේකේ ප්‍රසම්පාදන කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම කමිටුවක් හිටියා.ඊට පස්සේ අපි 2025.10.27 ටෙන්ඩර් විවෘත කරලා තාක්ෂණික ඇගයීම කමිටුවට දුන්නා නිර්දේශ ලබා ගන්න ඕනි නිසා. ඊට පස්සේ තාක්ෂණික ඇගයීම කමිටුව මගින් ලබා දීපු නිර්දේශ ටික අපි ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කළා ටෙන්ඩර් ප්‍රදානයට අදාළව තීරණයක් ගන්න.අපිට ආදාහානාගාරේ අලුත්වැඩියාවට ලංසුපත් 03ක් ඉදිරිපත් වෙලා තිබුණා. පස්සේ ටෙන්ඩර් මන්ඩලය තීරණය කරලා තිබුණා අවම ලංසු මුදල වෙච්ච රු.3,580,000.00 (රුපියල් තිස්පන්ලක්ෂ අසූදහසක්) ඉදිරිපත් කරලා තිබුණු එම්.එන්.ජී.කන්ස්ට්‍රක්ෂන්, 920/2, සියඹලාපෙවත්ත, දෙල්ගාඩ කියන ආයතනයට මේ කර්මාන්තය පිරිනැමීම සුදුසුයි කියලා. ඒ අනුව ආදාහනාගාරය අලුත්වැඩියාවට අදාළව සිදුකළ විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියට සහ ටෙන්ඩර් මණ්ඩලය මණ්ඩලය විසින් ලබා දීලා තියෙන තීරණයට සභාවේ අනුමැතිය අපි ගන්න ඕනි.

- ඒ අනුව අදාහනාගාරය අලුත්වැඩියාවට අදාළව සිදු කළ විවෘත ටෙන්ඩර් ක්‍රියාවළිය සඳහා අනුමැතිය ලබා දීමටත් , ටෙන්ඩර් මණ්ඩලයේ ඒකමතික තීරණය අනුව, අවම ලංසු මුදල වන රු.3,580,000.00 (රුපියල් තිස්පන්ලක්ෂ අසූදහසක්) ලංසුවක් ඉදිරිපත් කර තිබූ එම්.එන්.ජී.කන්ස්ට්‍රක්ෂන්, 920/2, සියඹලාපෙවත්ත, දෙල්ගාඩ යන ආයතනය වෙත මෙම කර්මාන්තය පිරිනැමීම සඳහා අනුමැතිය ලබා දීමටත්, මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන GA 4848 JCB යන්ත්‍රය අළුත්වැඩියාව සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.දර්මදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මේක මතභේදයට තුඩු දුන් කාරණාවක්. අපිට සිද්ධ වුණා මේකට ඉහළ නිළදාරින්ගෙනුත් උපදෙස් ගන්න. මේ ජේසීබී එක අපි ලක්ෂ 20ට ආසන්න ප්‍රමාණයක් වියදම් කරලා අළුත්වැඩියා කරලා තියෙනවා 2022 මැයි මාසේ. ඒ වුණාට දවස් 02 ක් 03ක් වගේ තමයි වැඩ කරලා තියෙන්නේ. දැන් මේක ආපහු අළුත්වැඩියා කරන්න රු.1984696.00ක ඇස්තමේන්තුවක් එවලා තියෙනවා. ඒකට වැට් එකත් එකතු වුණහම විසිතුන් ලක්ෂ හතළිස් එක්දහස් නවසිය හතළිස් එකයි ශත විසි අටක් යනවා. ඒ දළ ඇස්තමේන්තුව. මේ මැෂින් එක ගැලෙව්වට පස්සේ තව මොන මොන දේවල් කරන්න වෙයිද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා අපිට ඉහළ නිළධාරින් උපදෙස් දුන්නා මේ ගරු සභාවේ තීන්දුවක් ගන්න කියලා මේක වෙන්දේසි කරනවද නැත්තම් අර වගේ විශාල මුදලක් වියදම් කරලා අළුත්වැඩියා කරනවද කියලා. ඒකට ඔබතුමන්ලාගේ සහ තුමියන්ලාගේ අදහස ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා මේක වෙන්දේසි කිරීම සුදුසුයි කියලා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට රජයෙනුත් මේ අයවැයෙනුත් විශාල ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා. අයවැය එන්න කලින් අපිට රජයෙන් වෙනම අකෘතියක් එව්වා අපිට අවශ්‍ය යන්ත්‍රෝපකරණ එවන්න කියලා. අපි හාමුදුරුවනේ, ඒකට ජේසීබී එකක් දැම්මා. අපි දැන් වැඩ කරන ජේසීබී එක දවස් 02ක් වැඩ කළොත් දවස් 03ක් කැඩිලා. මං හිතනවා අපිට ජේසීබී එකක් හම්බ වෙයි කියලා. මං විශ්වාස කරනවා. මගේ නම් අදහස මේක වෙන්දේසි කළොත් හොඳයි කියලා. අපිට වැඩිපුරම එන්නේ පාරවල් හදන්න. විශේෂයෙන්ම බළන්ගොඩ ගත්තොත් නායයාම් වැඩියි. ඒ නිසා අපි හොඳ ජේසීබී එකක් තිබුණොත් හොඳයි. එහෙනම් මං හිතනවා අපි මේක වෙන්දේසි කරන්න පොදු අදහසකට එන එක හොඳයි කියලා. හරි එහෙනම් අපි ඒ විදියට ක්‍රියාත්මක කරමු නේද.

- ඒ අනුව GA 4848 JCB යන්ත්‍රය චක්‍රලේඛ වලට අනුකූලව වෙන්දේසි කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-10 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ඬේවිඩ් පීරිස් මෝටර් සමාගමේ දැන්වීම් පුවරු හිභය කපා හැරීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.දර්මදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මම මේ ගැන පොඩි පැහැදිලි කිරිමක් කරන්නම්.මොකද මේක ප්‍රගති සමාලෝචන රැස්වීමේත් නිතර ඇදෙනවා. මේ දැන්වීම් පුවරුවල හිඟ ගැන විගණන කමිටු රැස්වීමේදී සහ ප්‍රගති සමාලෝචන රැස්වීමේදිත් අපිට පෙන්වලා දීලා තියෙනවා. දැන්වීම් පුවරුවල හිඟ මුදල විදියට තියෙනවා රු.110280.00ක මුදලක්. අපි කලිනුත් මේකට සභා තීරණයක් අරන් තියෙනවා. ඒ තීරණයට අනුව අපිට කොමසාරිස් කාර්යාලයෙන් නිර්දේශ කරලා තියෙනවා ටෝකියෝ සිමෙන්ති දැන්වීම් පුවරුවට අදාළ රු.19200.00ක මුදල ගිණුම්කරණ දෝෂයක් විදයට අවසන් ගිණුම්වලින් නිවැරදි කරන්න කියලයි, ඩේවිඩ් පීරිස් මෝටර් සමාගමේ දැන්වීම් පුවරු ගාස්තුව වන රු.91080.00ක මුදල කපා හරින්න සභාවේ තීරණයක් අරන් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට එවන්න කියලයි. මොකද කොවිඩ් වසංගතය එක්ක වාහන ආනයනය සීමා වීමත් එක්ක ව්‍යාපාරයට සිදුවුණු හානිය නිසා තමයි මේ විදියට වෙලා තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

සභාපතිතුමා අපිට ඔක පොඩ්ඩක් පැහැදිලි කර ගන්න පුළුවන් වෙයිද. මේ සභාවේදි ගත්ත තීරණයක්ද මොකද ලොකු ගාණක්නේ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේක ගැටළුකාරී නම් අපි කාරක සභාවක් කරලා පැහැදිලි කරගමු. එහෙම හොඳයිනේ. එහෙනම් මේක සභාව කාරක සභාවක් කරන්න කවුරු හරි යෝජනා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

මේ ගරු සභාව කාරක සභාවක් කිරීමට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පෙ.ව.11.35ට මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව ලේකම්තුමිය විසින් මේ දැන්වීම් පුවරු ගාස්තු කපා හැරීම සම්බන්ධ පුළුල්ව පැහැදිලි කිරීමක් කාරක සභාව වෙත සිදු කොට, ඒ පිළිබඳ පැනනැගුණු ගැටළුකාරී තත්ත්වයට පිළිතුරු ලබා දෙන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

එහෙනම් මේ කාරක සභාව මහා සභාවක් කරන්න කවුරු හරි යෝජනා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**

මේ කාරක සභාව මහා සභාවක් කිරීමට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව පෙ.ව.11.40ට කාරක සභාව මහා සභාවක් බවට පත් කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

හරි ඒ පිළිබඳ දැන් ගැටළුවක් නැත්තම් අපි ඉස්සරහට යමු.

- ඒ අනුව ඩේවිඩ් පීරිස් මෝටර් සමාගමේ දැන්වීම් පුවරු ගාස්තුව වන රු.91080.00ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-11 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන මැද්දෙකන්ද තිරිවානා කැනීම් ව්‍යාපෘතිය වෙත ප්‍රවේශ මාර්ගයක් ලෙස බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග කොටසක් භාවිතා කිරීමට අවසර ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

රාස්සගල, වෙළේකුඹුර පදිංචි එම්.කේ.නිලන්ත ජයසිරි මහතා විසින් තමයි මේ ඉල්ලීම කරලා තියෙන්නේ. ඒ අනුව මේ තිරිවානා කැනීම් ව්‍යාපෘතිය මගින් ලබා ගන්න තිරිවානා ප්‍රවාහනය කරන්න අපේ සභාවට අයිති කිරමණාගමගොඩ මාර්ගය භාවිතා කරන්න අවසර ඉල්ලනවා. කියුබ් 01 ටිපර් රථයක් භාවිතා කරලා ප්‍රවාහනය කරන්නයි , කැනීම් කටයුතු අවසන් වුණාට පස්සේ ආපහු ප්‍රතිසංස්කරණය කරන්නයි එකඟතාවය ඉල්ලලා තියෙනවා. ගිවිසුමකට යටත්ව තමයි අපි මේ සඳහා අනුමැතිය දෙන්න ඕනි . ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් කිරමණාගමගොඩ මාර්ගය තිරිවානා ප්‍රවාහනය කිරීමේ කටයුතු සඳහා ගිවිසුමකට යටත්ව ලබා දීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-12 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන මාවෙල වසමට හියුම් පයිප්ප ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා, මන්ත්‍රීවරුන්, ලේකම්තුමිය ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. ඇත්තටම මෙම යෝජනාවෙන් මාවෙල වසමට අදාළව හියුම් පයිප්ප ඉල්ලලා තියෙන්නේ ඉදිරියතලාව, අඹේහින්න, වලකඩගම කියන මාර්ගයට අදාළව. අපි ලක්ෂ 25ක් යොදවලා මේ මාර්ගය කොන්ක්‍රීට් කරලා තියෙනවා. තව පොඩි ප්‍රමාණයක් තමයි සංවර්ධනය කරන්න තියෙන්නේ. ඔය හියුම් පයිප්ප අවශ්‍ය ප්‍රදේශයේ අඩියක වගේ බෝක්කුවක් තමයි තියෙන්නේ. අඩි 02ක විතර විශ්කම්භයක් තිබුණ නම් අපිට ඕක හදා ගන්න තිබුණා. අපේ චතුරිකා මන්ත්‍රීතුමියත් මේ ගැන දන්නවා . අපිට වඩා එතුමිය තමයි මේ මාර්ගය භාවිතා කරන්නේ. ඒ නිසා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ මාවෙල වසමට අවශ්‍ය මේ හියුම් පයිප්ප ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන්න කියලා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපේ කාර්මික කාර්මික නිළධාරිතුමා විසින් ස්ථානීය පරීක්ෂණයක් කරලා අපිට මේ සම්බන්ධව නිර්දේශයක් ලබා දීලා තිබුණා විෂ්කම්භය අඩි 1.5ක් හා දිග අඩි 06න් යුතු හියුම් පයිප්ප 02ක් ප්‍රජා පාදක සමිතියකට නිකුත් කරලා ආදාළ කාර්යය ඉටු කර ගන්න එක සුදුසුයි කියලා. ඒ නිර්දේශය අනුව අවශ්‍ය හියුම් පයිප්ප ලබා දෙන්න සභාවේ අනුමැතිය හිමි වෙයි.

- ඒ අනුව ඉදිරියතලාව, අඹේහින්න, වලකඩගම කියන මාර්ගයට අදාළව විෂ්කම්භය අඩි 1.5ක් හා දිග අඩි 06 න් යුතු හියුම් පයිප්ප 02ක් ප්‍රජා පාදක සමිතියකට නිකුත් කොට ආදාළ කාර්යය ඉටු කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-13 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මේ යෝජනාව සම්බන්ධයෙන් අපි ඒකාබද්ධ කාරක සභාවක් තිබ්බා. මේ සඳහා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා බොහෝ පිරිසක් සම්බන්ධ වුණා. කාලය පිළිබඳ ගැටළුවක් තිබුණු නිසා අපි මන්ත්‍රීවරුන් දැනුවත් කරන සමූහය හරහා දැනුවත් කිරීමක් කළා එදිනට සම්බන්ධ වෙන්න කියලා. අපි හැමෝම ඒ සමාජ මාධ්‍යය ගෲප්වල ඉන්න නිසා තමයි අපි පණිවිඩය ඒ විදියට යොමු කළේ ලිපි වලින් දැනුවත් කරන්න ප්‍රමාණවත් කාලයක් නැති හින්දා. ඒ අනුව අපි ඒකාබද්ධ කාරක සභාවේදී අපි මේ හැම ශීර්ෂයක්ම වෙන වෙනම අරගෙන පුළුවල්ව සාකච්ඡා කළා. ඒවයේ තිබුණු අඩුපාඩුකම්, සංශෝධනය කරන්න ඕනි තැන් ඒ සියල්ලම අපි කතා කරලා පැහැදිලි කරගෙන නිවැරදි කර ගත්තා. ඒ අනුව අදාළ සංශෝධන ඇතුළත් කරලා තමයි මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ තුමියන්ලාගේ අතට පත් වෙච්ච 2026 අයවැය කෙටුපම්පත සකස් කළේ. ඒ නිසා අපි දැන් බලාපොරොත්තු වෙන්නේ මේ කෙටුම්පතට අනුමැතිය ලබා ගැනීම.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමා මේකේ පොඩි පොඩි කාරණා ගැන අපිට අදහස් දැක්වීමක් කරන්න පුළුවන්ද.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
ගරු මන්ත්‍රීතුමා අපි ඒකාබද්ධ කාරක සභාවක් තිබ්බෙම ඔය ගැන පුළුල්ව අදහස් අරගෙන සාකච්ඡා කරන්න ඕන නිසා සහ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට මේ පිළිබඳ වෙන වෙනම අවබෝධයක් ලබා දෙන්න ඕන නිසා. අපි සෑහෙන වෙලාවක් අරගෙන සාකච්ඡා කරලා තමයි ඕක හැදුවේ. මේ අවස්ථාවට සැළකිය යුතු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ප්‍රමාණයක් ආවා. ඔවුනුත් ඒ පිළිබඳව දන්නවා. ඒ වගේම මේ පිළිබඳව යම් ගැටළුවක් මතු වුණොත් කියලා අපි කෙටුම්පත හැමෝටම ලැබෙන්න සැලැස්සුවා. අපේ හිටපු ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරු දන්නවා සාමාන්‍යයෙන් අයවැය ගැන කතා කරන කොට අපි ඒකාබද්ධ කාරක සභාවක් ගන්නෙම, ඒ වගේම ඒකේ තේරුමම තමයි මේ පිළිබඳව පුළුවල්ව සාකච්ඡා කිරීම. මොකද අපිට මේ මහා සභා රැස්වීමේදී මේ ගැන කතා කරන කොට අපිට ප්‍රායෝගික ගැටළු ටිකකුත් තියෙනවා . අපේ අර ගරු මන්ත්‍රීතුමා සම්බන්ධීකරණ කමිටුවේදී කිව්වා සේම අපි අඩු ආදායම්ලාභී සභාවක්. එතකොට අපි මේ කතා කරන හැමදේම වාර්තාවට ගන්න ඕනි. මං හිතන්නේ මං මේ කතා කරන ටිකත් වැඩියි කියලා. අපි මේ වාර්තාව 37කට යවන්න ඕනි. ලිපි ද්‍රව්‍ය මිලයි. හැබැයි අපි ඒකාබද්ධ කාරක සභාවේදී එහෙම ගන්නේ නැහැ. මේකේ රීතියක්ම තියෙනවා ඒකාබද්ධ කාරක සභාවක් තුළ සාකච්ඡාවට ගත යුතුයි කියලා. මොකද ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ තුමියන්ලාගේ අදහස්, යෝජනා සහිතව තමයි අපිට ඉදිරි වර්ෂය සඳහා අයවැය සකස් කරගන්න වෙන්නේ. ඒ අනුව තමයි අපි ඒ කාරක සභාව ගත්තේ. ගරු මන්ත්‍රීතුමාට ශීර්ෂයක මොනවා හරි ගැටළුවක් තියෙනවනම් අපිට කතා කර ගන්න පුළුවන්. එදා සම්බන්ධ වුණු අයට මොකුත් ගැටළුවක් නැතිව ඇති.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමා මට ශීර්ෂ 03ක පොඩි ගැටළු ටිකක් තියෙනවා. මට ඒක පැහැදිලි කර ගන්න පුළුවන්ද.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි මන්ත්‍රීතුමා අපි එනෙම් මේක කාරක සභාවක් කරමු. කවුරුහරි යෝජනාව කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය</u>**
මේ ගරු සභාව කාරක සභාවක් පත් කරන්න මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව ගරු සභාව ප.ව.12.00 ට කාරක සභාවක් බවට පත් විය.

අනතුරුව ලේකම්තුමිය විසින් අදාළ ශීර්ෂ 03 පිළිබඳව සහ එය සකස් වූ ආකාරය පිළිබඳව වෙන වෙනම කාරක සභාව වෙත පැහැදිලි කරන ලදී. ඒ පිළිබඳ පැවති ගැටළුව නිරාකරණය වූ බැවින් සහ වෙනත් ගැටළු නොමැති වීම හේතුවෙන් ගරු සභාපතිතුමා විසින් කාරක සභාව මහා සභාව පත් කිරීමට යෝජනා කරන ලෙස දන්වන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා</u>**
මම මේ කාරක සභාව සභාව බවට පත් කිරීමට යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව ප.ව.12.25 ට කාරක සභාව නැවතත් මහා සභාව බවට පත් කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි එහෙනම් අයවැය කෙටුම්පතට අදාළ වෙන මොනවත් ප්‍රශ්න, ගැටලු නැත්තම් අපිට තියෙන්නේ 2026 අයවැය කෙටුම්පතට සභා අනුමැතිය ලබා දෙන්න.

- ➢ ඒ අනුව 2026 අයවැය කෙටුම්පත සඳහා සංශෝධනවලින් තොරව අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
7.1ටෙන්ඩර් කමිටු වාර්තාව

- ➢ සභාව විසින් සළකා බලන ලදී.

7.2මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

- ➢ සභාව විසින් සළකා බලන ලදී.

**08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025 ඔක්තෝබර් මාසයට අදාළ ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

- ➢ සභාව විසින් සළකා බලන ලදී.

**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන්ද, ලේකම්තුමියන්ගෙන්ද , මාධ්‍යවේදී මහත්වරුන්ගෙන්ද අවසරයි. මම මේ අවස්ථාව ලබා ගත්තේ විශේෂ ස්තුතියක් කරන්න. මොකද දැනට මාස එකහමාරකට විතර උඩදී මගේ වසමේ දාමහන සියඹලාකඳුර පාරේ ප්‍රාදේශීය සභාවෙන් ගිහින් තියෙනවා නිරීක්ෂණ චාරිකාවකට. ඒ ගිහිල්ලා දැඩි අවදානමක් තියෙනවා කියලා පාරේ කඩා වැටීමට ලක් වෙච්චි තැනක, මට දැනුම් දීමක් කළා ඉක්මනට මොනවහරි පියවරක් ගන්න කියලා. ඊට පස්සේ මම කට්ටිය එක්ක එකතු වෙලා වැලි කොට්ට දාලා ඒක හැඳුවා. ඒ සඳහා මට මේ ආයතනයෙන් ජේසීබී යන්ත්‍රය පැය 02ක කාලයකට ලබා දුන්නා. පස්සේ වැලි කොට්ට අහුරලා ඒ පාර ආරක්ෂා කර ගන්න ලොකු වෙහෙසක් අපි ගත්තා. පස්සේ දවස් 02යි වහින්න ගත්තේ ඒ බැම්මේ කොටසක් පහළට කඩා ගෙන ගියා. සිකුරාදා දවසක හවස 6ට විතර තමයි අනතුර වුණේ. ඊට පස්සේ මම සභාපතිතුමාට දැනුම් දීමක් කළා. ඊට පස්සේ ක්ෂණිකව එතුමා මට දැනුම් දුන්නා පහුවදා සෙනසුරාදා නිවාඩු වුණාට කමක් නැහැ මට සභාවට එන්න කියලා. ඉතින් මම පහුවදා උදේම ආවා. ඊට පස්සේ අපේ කාර්මික නිළධාරි දෙපළත්, සභාපතිතුමාත් අපි වෙනුවෙන්ම ඇවිල්ලා ඒ වැඩ කටයුතු සාර්ථකව කරලා දුන්නා. ඊට පස්සේ කොමසාරිස්තුමාට සහ ආණ්ඩුකාරතුමියටත් කතා කරලා දවස් 02කින් කරන වැඩේ අපිට පැයකින් කරලා දුන්නා. දැන් ඒ අවදානම නැති කරන්න ඒ බැම්ම වෙනුවෙන් අපිට ලක්ෂ 80ක මුදලක් වෙන් කරලා දුන්නා. ඒ නිසා මම වසම වෙනුවෙන් සහ ජනතාව වෙනුවෙන් සභාවටත් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මට තව පොඩි කරුණක් ගැන කතා කරන්න ඕනි. අපි දැන් පත් වෙලා මාස 05යි වෙන්නේ. ඉතින් ඒ මාස 05 ඇතුළත අපේ මේ සභාවේ කොට්ඨාශ ඇතුළේ විතරක් නෙවෙයි මුළු ලංකාව පුරාම විශාල වශයෙන් සංවර්ධන යෝජනා ගෙනල්ලා ඒවා ක්‍රියාත්මක කරනවා. ඒකට හොඳ උදාරණයක් තමයි මගේ කොට්ඨාශයේ පාර. හදන්න වුට්ට වුට්ට ප්‍රමාද වුණා වැලි ප්‍රශ්නේ නිසා. ඒ කියන්නේ මුළු ලංකාවේම පාරවල් මේ විදියට සංවර්ධනය වෙනවා. ඒ ගැන මට නිහතමානී ආඩම්බරයක් තියෙනවා. මොකද මෙතෙක් කල් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වුණා. නමුත් මෙවැනි මාස 05ක් වගේ කෙටි කාලයක් තුළ මෙවැනි විශාල ප්‍රමාණයකින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ නිසා මම කියන්නේ දැන් ඉස්සර වගේ නෙවෙයි කොන්ත්‍රාත්කරුට ඕනි විදියට නෙවෙයි පාර හැදෙන්නේ. ගමේ මිනිසුන්ට ඕනි විදියට ඒ හැමදේම වෙන්නේ. ඉතින් මං ඇත්තටම සතුටු වෙනවා. දාමහන ප්‍රදේශයට දැනට වෙන් වෙලා තියෙනවා කෝටි 01යි ලක්ෂ 80ක මුදලක්. ඒකෙන් කෝටියක මුදලකින් දැනට සංවර්ධන යෝජනා ඉවර කරලා තියෙනවා. ඉතින් ඉදිරියටත් සෑම කොට්ඨාශකම මෙවැනි සංවර්ධන යෝජන ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාගෙන් සහයෝගය බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා**

සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු සභාපතිතුමනි, මට කතා කරන්න තියෙන්නේ වේළිඔය පොළ සම්බන්ධ ගැටළුව. ගිය සතියේ ඔබතුමා ඇවිල්ලා යම්තාක් දුරට ඒ ප්‍රශ්නය නිරාකරණය කළා කියලා මට දැනුණා. මීට සති කීපයකට පෙර එතන මට පන්තියක උගන්වන්න බැරි මට්ටමක් තිබුණේ. මට ආරංචි වුණ විදියට ලබන සතියේ ඔබතුමා රැස්වීමක් කැඳවලා තියෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා බහුතර වෙළෙන්දන්ගේ ඉල්ලීමට සවන්දීලා , ඒ කියන්නේ කෙනෙකුගේ දෙන්නෙකුගේ පෞද්ගලික අවශ්‍යතා ගැන හිතන්නේ නැතිව, වේළිඔය පොළ ලස්සන කරන්න ඔබතුමා මැදිහත් වෙයි කියලා. ඒ ඉල්ලීම තමයි මට කරන්න තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා**

සියලු දෙනාගෙන්ම අවසරයි. මම මගේ අදහස් දැක්වීම උපරිම විනාඩි 03ට සීමා කරන්න උත්සාහ කරන්නම්. මම අද දිනය ඉතාම විශේෂයි කියලා සළකනවා. මට මතකයි කවුරුත් දන්නවා දැනට අපේ විධායකය ඒ කියන්නේ අපේ ජනාධිපතිතුමා පත් වෙලා අදට මාස 14යි. ඒ වගේම ව්‍යවස්ථාදායකය ඒ කියන්නේ පාර්ලිමේන්තුව පත්වෙලා අදට හරියටම අවුරුද්දයි. ඒ වගේම අපේ ගරු සභාව පත් වෙලා අද මේ පවත්වන්නේ 06 වෙනි සභා වාරය. ඉතින් අපි ආපු මේ ගමන් මාර්ගයේ මම මුළු රටේම සංවර්ධනය ගැන නෙවෙයි කතා කරන්නේ. මම නියෝජනය කරන කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කළුපේඩිගම, දියවින්න, කෝන්ගංහමංකඩ කියන වසම් 03 මගේ කොට්ඨාශයේ මේ

දක්වා සිදු වෙලා තියෙන සංවර්ධන යෝජනා ටික ඉදිරිපත් කරන්නයි මම සූදානම් වෙන්නේ. ඉතින් අපි දන්නවා අපිට ලැබුණේ හොඳට සල්ලිවලින් පිරුණු භාණ්ඩාගාරයක් තියෙන ආණ්ඩුවක් නෙවෙයි. ඉතාම දුප්පත් අපේ වචනෙන් කියනවනම් බංකොලොත් වුණු රටක් විදියට තමයි අපිට ලැබුණේ. එහෙම ලැබිලා අද වෙනකොට මම දන්න විදියට, මම දන්නේ විශේෂයෙන් අපේ වසම් ටික ගැන, ඉතාම විශාල සංවර්ධනයක් අපි බලාපොරොත්තු නොවුණ තරමේ වැඩ කොටසක් අපේ මේ වසම් 03 වෙනුවෙන් මේ වෙනකොට සිදු වෙලා තියෙනවා. ඒ ගැන තමයි මම ප්‍රකාශ කරන්න සූදානම් වෙන්නේ. කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා දැනට රුපියල් මිලියන 280ක් වෙන් කරලා තියෙනවා. එකේ වැඩ ආම්භ කරලා තියෙනවා. ඒ වගේම කෝන්ගහමංකඩ ජල ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කරලා තියෙනවා. ලබන මාසේ මැද වෙනකොට ඒකෙ වැඩ පටන් ගන්නවා. ඒ වගේම කල්තොට කපුගල මාර්ගයේ කිලෝ මීටර් 6 .5ක් සංවර්ධනය කරන්න මිලියන 25ක් වෙන් කරලා තියෙනවා. ඒකේ වැඩ මේ වෙනකොට කෙරීගෙන යනවා. ඒ වගේම කළුපේඩිගම සද්ධාතිස්ස ඇළ සංවර්ධනය ඒකට මිලින 3.3ක් වෙන් කරලා තියෙනවා. ඒකේ වැඩ මේ වෙනකොට අවසන්. ඊළගට දියවින්නේ පුබ්බරපොත ඇළ සංවර්ධනය කරන්න රුපියල් මිලියන 1.3යි. ඒකෙත් වැඩ අවසන්. දියවින්න පුබ්බරපොත මාර්ගය මිලියන 01යි. ඒකෙත් වැඩ අවසන්.කෝන්ගහමංකඩ වෙළමැද පාර සංවර්ධනයට මිලියන 01යි. දියවින්න වෙළන්ආර බෝක්කුව සංවර්ධනයට මිලියන 01යි.ඒ වගේම අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස හදන්න මුදල් වෙන්වුණා. රුපියල් ලක්ෂ 10 නිවාස 04ක් සහ ලක්ෂ 2.5 නිවාස 03 ක් මේ වන විට ඉදිවෙමින් පවතිනවා. ඒ වගේම අලි එන ප්‍රදේශවල තිබුණු වීදි ලාම්පු 79ක් අපේ සභාවෙන් දාලා තිබුණා වසම් 03ට. ඒ වගේම අළුත්බැද්ද පාලම පාලම අසළට අලුතින් වීදි ලාම්පුවක් සවිකළා. එතකොට මම මේ කිව්වේ රටේ සංවර්ධනය පිළිඹිබුවෙන පැතිකඩක්.ඉතින් මම නියෝජනය කරන කොට්ඨාශයෙන් මෙතරම් සංවර්ධන වැඩ කෙරෙනවනම් මුළු රට තුළම කොතරම් සංවර්ධන වැඩ කටයුතු සිදු වෙනවද කියලා අපිට අවබෝධ කර ගන්න පුළුවන්. අවංකවම අපි පිළිගන්න දෙයක් අපිට පිළිගන්නම වෙනවා . මට මතකයි අපේ ජනාධිපතිතුමා අයවැය කතාව කළා පැය 04යි විනාඩි 20ක් විතර මම ඒ පැය ගාණම ඒකට සවන් දුන්නා. ඒ කතාවේදී කිව්වා ලබන වසර සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන්න රුපියල් මිලියන 24000ක් වෙන් කරලා තියෙනවා කියලා. ඒ කියන්නේ ලබන අවුරුද්ද වෙනකොට අපේ ගම්වල තියෙන ග්‍රාමීය මාර්ග 50%ක් විතර අවසන් කරන්න පුළුවන් වෙයි කියලා අපිට විශ්වාසයක් තියෙනවා. මේ සඳහා රාජ්‍ය නිළධාරින්ගේ මැදිහත්වීමත් අපි බොහෝ ගරු කොට සළකනවා. මගේ කතාව මං ගොඩක් දුර අරන් යන්නේ නැහැ. මේක අවංකවම පිළිගන්න ඕන දෙයක්. අයවැය කතාවේදි අයවැය විවාදය පැවැත්වුවා. ඒ විවාදයේදී සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා මෑත ඉතිහාසයේ රජයේ භාණ්ඩාගාරයේ ඩොලර් වලින් පිරුණු අයවැයක් මං දැක්කා කියලා. ඉතාමත් අගය කළ යුත්තක් කියලා එතුමා කිව්වා. එතුමා කියන්නේ ඒ පක්ෂයේ ඉන්න ආර්ථික විද්‍යාව පිළිබඳ හසළ දැනුමක් තියෙන අයෙක්. ඉතින් ඒකෙන්ම පේනවා අපි ඉදිරි වර්ෂයට අපි බලාපොරොත්තු වෙන විදියට යහපත් සංවර්ධනයක් වෙයි කියලා. ඒ වගේම රටකම එකට තේමාව යටතේ අපේ ජනාධිපතිතුමා මත්ද්‍රව්‍ය උවදුර පිටුදකින්න දැවැන්ත වැඩ පිළිවෙලක් අරන් යන්නවා. ඒ අපේ දරුවෝ වෙනුවෙන්. ඒ සඳහාත් ඔබ සැමගේ සහය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>

ගරු සභාපතිතුමාට සහ මේ මන්ත්‍රීවරුන්ට සහ කාර්ය මණ්ඩලයට ඒ වගේම මගේ මිත්‍රයා ඕකේට මගේ ස්තුතිය පළ කරනවා අපේ ප්‍රදේශය වෙනුවෙන් ඒ ඉල්ලීම් කරපු වීදි ලාම්පු ටික ලබා දීම ගැන.ඒ වගේම ගරු සභාපතිතුමා, ඔබතුමන්ලා හෙට ඉල්මහ සමරුවට සම්බන්ධ වෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා.අපිට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. එතකොට ඔබතුමන්ලා විශේෂ මහා සභාවක් තියලා දිනයක් වෙන් කර ගෙනද , බ්‍රහස්පතින්දා තියන්න තිබුණු මහ සභාව අද තියලා, ඔබතුමන්ලා ඒ රැස්වීමට හෙට සහභාගි වෙන්නේ. විශේෂ මහා සභාවක් තියලා ඒ වගේ කටයුත්තක් දාගන්නවා කියන එකත් අති විශේෂයි. දැන් මම කියන්න ආවේ අපේ පොදු ජන පෙරමුණේ මන්ත්‍රීවරුන් පක්ෂයක් නියෝජනය කරලා තමයි මන්ත්‍රීවරුන් වෙන්නේ. නැත්තම් නිකන් අයාලේ ගිහිල්ලා මන්ත්‍රීවරුන් වෙන්න බැහැ. හැමෝටම පක්ෂයක් තියෙනවා. එතුමන්ලා හෘද සාක්ෂියට එකගව එදා ඔවුන්ගේ පක්ෂ රැස්වීමට සහභාගි වෙනවා කියලා නිවාඩු ඉල්ලලා, නමුත් මේ ගරු සභාව ඒක අනුමත නොකර ඒ මන්ත්‍රීවරු 05 දෙනාගේ දීමනාව නැති කළා. ඒක අපි නැවත වතාවක් කල්පනා කරලා බලන්න ඕනි. මගේ අතේ

තියෙනවා ආණ්ඩුකාරතුමා අතින් එවපු රීති. ඉතින් ඒක බැලුවහම කිසිසේත්ම ඒගොල්ලන්ගේ දීමනාව අහෝසි කරන්න බැහැ. අනික මේකේ තියෙනවා සභිකවරුන්ගේ පැහැදිලි කිරීම කියලා. මම එහෙම කවුරුත් විවේචනය කරන්න කැමති කෙනෙක් නෙවෙයි. මම උපරිම සුහදව වැඩ කරන්න කැමති කෙනෙක්. ඔබතුමා කිව්වා මේ පැත්තෙන් 03යි, මේපැත්තෙන් 03යි සභාවට අදාළ කරුණු තමයි පැහැදිලි කරන්න ඕනි කියලා. එතකොට මේ ගොඩනැගිල්ල හැදුවේ මේ ගරු ජනාධිපතිතුමා සහ ආණ්ඩුව එන්න කලින්. මේ වසම් 53 ප්‍රාදේශීය ලේකම් කාර්යාල තියෙනවා, පාසල් තියෙනවා, පාරවල් තියෙනවා, ඉස්කොල තියෙනවා, ඉස්පිරිතාල තියෙනවා, ඕවා ඔක්කොම උඩින් ඇවිල්ලා නැති නිසා කලින් හිටපු අය කිසිම දෙයක් නොකරපු ගාණට කතා කරන එක හොඳ නැහැ. ඇත්තටම මෙතන ඉන්න සියලු දෙනාම ප්‍රකම්පිත වුණා. ජනතාව බලය දෙන්නේ පවතින ආණ්ඩුවට වැඩ කරන්න. නැතුව ගෙදර ඉන්න නෙවෙයිනේ. මටත් කියනවනම් කියන්න පුළුවන් . මෙතන මේ සභාවට අයිති දේවල් විතරක් කතා කරන්න. ඇවිල්ලා මාස 05යි කිව්වා. අපි දෙගොල්ලෝ අතර කුපිතය සහ වෛරය ඇති වෙන විදියට , ආවේගය ඇති වෙන විදියට , මූණ බලාගන්න බැරි විදියට මින් ඉදිරියට ඔබතුමන්ලා කතා කරන්න එපා. මට නෙවෙයි ප්‍රශ්නේ, ගරු සභාපතිතුමාට, එතකොට මේ සභාව කර ගෙන යන්න බැරි වෙනවා. අපිත් ඊට පස්සේ අපි දන්න හැම ශිල්පයක්ම දාලා ඔබතුමාව යම් යම් අපහසුතාවන්ට පත් කරනවා. ඉතින් එතනට අපි ගේන්න එපා. අපිත් මෙතනට එන්නේ පොත්පත් පරිශීලනය කරලා. අපිටත් දැනුමක් තියෙනවා. මමත් අවුරුදු 05ක් මේකේ හිටියා. එම නිසා බොහොම සංයමයෙන් මේ සභාවේ අදහස් දක්වන්න. අපේ මන්ත්‍රීවරු ආවේගයට පත්වෙන විදියට අදහස් දක්වන්න එපා. බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියළු දෙනාගෙන්ම අවසරයි. අපේ දීමනාව පිළිබඳ කතාවක් ආපු නිසයි මම මේ අවස්ථාව ගත්තේ. අපි මේ දීමනා ගැටළුව ගැන කොමසාරිස්තුමාට ලිපියක් යොමු කළා. නමුත් මේ වෙනතෙක් ඒ පිළිබඳව කිසිම තොරතුරක් නැහැ. අපිට ඒ පිළිබඳ තොරතුරක්වත් අඩුම තරමේ දැන ගන්න ලැබෙනවනම් හොඳයි. ඇත්තටම මම කණගාටුවට පත් වෙනවා මේ වනතෙක් මේ සඳහා පිළිතුරක් නොලැබීම ගැන.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, විශාල වශයෙන් කතා කරන්න බලාපොරොත්තුවක් නැහැ. ඇත්තටම මේ අයවැයෙන් වතු කම්කරුවන්තේ වැටුප් වැඩි කිරීම ගැන අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාටත්, ඒ රජයටත් අපගේ විශේෂ ස්තූතිය පුද කර සිටිනවා.රු.1550.00ක් දක්වා වැටුප වැඩි වුණා. තව රු. 200.00ක් රජයෙන් දෙනවා. ඒක ගැන මම පොඩ්ඩක් හොයලා බැලුවා. යම් යම් පාර්ශව විසින් කියනවා , දින 25ක් වැඩ කළොත් තමයි ඒක දෙන්නේ කියලා. නමුත් සුන්දරලිංගම් ඇමතිතුමා කිව්වා එක දවසක් වැඩ කළත් රු.200.00 දෙනවා කියලා. ඒ නිසා නැවත වතාවක් ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම රජයේ සේවකයන්ටත් වැටුප් වැඩි වීමක් වුණා. විශ්‍රාමිකයන්ටත් විශ්‍රාම වැටුපේ වැඩිවීමක් වුණා. ඒ වෙනුවෙනුත් මම ජනාධිපතිතුමා ඇතුළු රජයට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම පුද්ගලික ස්තුතියත් පුද කරනවා. මොකද අපේ මන්ත්‍රීවරු 06ක කලින් ආණ්ඩුවේ ඉඳගෙන සටන් කළත් අපිට වතු කම්කරුවන්ගේ දීමනාව වැඩි කර ගන්න බැරිවුණා. මේක කිසිම වර්ජනයක් නොකර අපිට ජනාධිපතිතුමා ලබා දීපු එකට මම ගොඩක් සතුටු වෙනවා. ඒ පාර්ශවයත් සතුටු වෙනවා. අපේ පවුලෙත් ගොඩක් රජයේ සේවකයෝ ඉන්නවා. මගේ නෝනත් පාසල් ගුරුවරියක්. රජයේ සේවිකාවක්. ඒ නිසා අපේ පවුලේ විශේෂ ස්තුතියත් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයට පළ කර සිටිනවා.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, ලේකම්තුමියනි සහ මන්ත්‍රීවරුන් සියළුම දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමාගේ නිවේදන වලදී පැහැදිලි කළා අපි තරම් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් ගෙනියන ආණ්ඩුවක් පුද්ගලිකව සහ අපගේ හෘද සාක්ෂියට එකඟව මම නම් ඇත්තටම දැකලා නැහැ. ඉතාම ප්‍රජාතන්ත්‍රවාදිව, හැමෝටම ඒ කියන්නේ ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂවල නියැලෙන අය දිහාවත් අඩුමගානේ රවලවත් බලන්නේ නැති දේශපාලන සංස්කෘතියක් අපි කරගෙන යන්නේ. ඒක කිසිම තැනක අපට බය නැතුව ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ වගේම තමාගේ දේශපාලන ව්‍යාපාරය

සම්බන්ධව කිසි කෙනෙකුට නොකියන්න කියන්න කියලා කොතනකවත් කියලා නැහැ. ඔබතුමන්ලාටත් ඒකට අයිතිය තියෙනවා. ඔබතුමන්ලා නියැලෙන දේශපාලන පක්ෂ සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන්න, කරපු වැඩ ගැන කියන්න කාගෙන්වත් බාධාවක් නැහැ. අපි ආණ්ඩු පක්ෂය විදියට හැමවෙලේම බොහොම ඉවසිලිවන්තව තමයි කටයුතු කරන්නේ. කිසි කෙනෙක් මොකුත් කියන්නේ නැහැ. ඔබතුමන්ලාටත් අයිතියක් තියෙනවා නියැලෙන දේශපාලන ධාරාව සම්බන්ධව අදහස් කියන්න , කරපු වැඩ ගැන කියන්න සභාවට අදාළව , ඒකේ කිසිම ගැටලුවක් නැහැ. අපි ඔබතුමන්ලා කියන දේවල් සමග තර්ක කරනවා, අවස්ථාව දෙනවා ඒ නිසා කවුරුත් වෙවුලන්න, කේන්තිගන්න, අවශ්‍යතාවයක් නැහැ. අපි තර්කානුකූලව මොනවහරි ගැටලුවත් තියෙනවනම් කතා කරලා නිසි උත්තර ලබා ගෙන දෙපාර්ශවයම එකම පිරිසක් වගේ වැඩ ටික කර ගෙන යමු. හැබැයි අපි මෙතනට ඇවිල්ලා ඉන්නේ ඔබතුමා කිව්වා වගේ යම් දේශපාලන ධාරාවකින් , ඒ ආදර්ශය , ඒ ඥානය, ඒ ගුණධර්මත් එක්ක ගොඩනැගුණු අදහස් එකක් අපි වැඩ කරන්නේ . අර දර්මදාස මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ කෙටි කාලය ඇතුළත සංවර්ධන කටයුතු ගොඩක් කළා. එතකොට මෙවැනි පොඩි කාලයක් තුළ මෙතරම් විශාල සංවර්ධන වැඩ ටිකක් කරන්න පුළුවන් වුණ එක ගැන එතුමාට දැනිච්ච හැඟීම තමයි අදහස් විදියට ප්‍රකාශ කළේ. එහෙම නැතුව අනිත් දේශපාලන පක්ෂ වැඩනොකර හිටියා කියලවත්, ජනතාවගෙන් ප්‍රත්ක්ෂේප වුණා කියලවත් නෙමෙයි එතනදි අදහස් වුණේ. ඒ නිසා අපි හැමවෙලේම කට්ටියම එකතු වෙලා එකට ගමනක් යමු. ඒ වගේම අපි අසීමිත කැප කිරීම් කරමින් තමයි මේ පක්ෂය ගොඩ නැගුවේ. ඇත්තටම මේක ජනතාවදී පක්ෂයක් වගේම ජනතාවාදී ආණ්ඩුවක්. මේතැන ගොඩ නගන්න හැමෝම බොහොම කැප වුණා. අපේ ගරු සභාපතිතුමා මේ පක්ෂය වෙනුවෙන් අසීමිතව කැපවුණු කෙනෙක්. ඉතින් ඒ වෙනුවෙන් කැපවුණු පිරිසක් කලකට කලින් ම්ලේඡ්ඡ විදියට ඝාතනයට ලක්වුණා. අපි ඒ දිනය ඉල්මහ සමරුව විදියට හෙට දිනයේ සමරනවා. ඉතින් මෙවැනි සාමකාමී දේශපාලන පක්ෂයක් රැක ගන්න විපක්ෂයේත් සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා.

වෙනත් අදහස් හා යෝජනා නොමැති බැවින් සභාව ප.ව.1.20 ට අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව